## සති පාසල කාර්ය පත්‍රිකාව

**පාඩම හෝ ඒකකය - 6.3.1 ලාක්ෂා නිර්මාණ අගයමු.**

නිපුණතාව 6.0 : ආගමික හා සංස්කෘතික වශයෙන් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 6.3 : ශ්‍රී ලංකාවේ ලාක්ෂා කර්මාන්තය අධ්‍යයනය හා රසාස්වාදය කරයි.

### පෙර ඉගෙනුම් අවස්ථා/ ශිෂ්‍යා කළයුතු කාර්යන්

01. ලාක්ෂා කර්මාන්තය පිළිබඳව සැකසුන ඡායාරූප, වීඩියෝ පට බලන්න. ලාක්ෂා කර්මාන්තය සිදුකරණ ආකාරය පියවරෙන් පියවර හොදට බලන්න. ඒ සඳහා පහත යූ ටියුබ් සබැඳි උදව් කර ගන්න.

https://youtu.be/aIw5WM3mk5o
https://youtu.be/IA2VjM5xZf8

02. වාහල්කඩ හා වටදාගෙය ගැන ලියවී ඇති පොත්පත් සොයාගෙන කියවන්න.
චිත්‍ර කලාව-තිලකරත්න දිගන්වෙල මහතා-වාහල්කඩ (පිටුව 88)
චිත්‍ර කලාව-අ.පො.ස.සා/පෙ - එච්.ඩබ්.කුමාරතුංග .මහතා (පිටුව 80).

.

03. විකිපීඩියා ලිපි සොයා කියවන්න - si.wikipedia.org/wiki/ලාකිරි_වැඩ

04. මේ පිළිබඳව ලියවුනු පුවත්පත් ලිපි/ වෙබ් පිටු සොයා කියවන්න

වෙබ් පිටු - https://sithuwamathwela.blogspot.com/2020/05/631.html
localguidesconnect.com/t5/General-Discussion/හපුවිද-ලාක්ෂා-ගම්මානය/td-p/1274538

## කියවීම් පත්‍රිකාව

**ඓතිහාසික පසුබිම**

මහනුවර යුගයේ දී ලාක්ෂා කලා කර්මාන්තය වඩාත් ප්‍රචලිත ව පැවති බවට සාධක පවතී. " කොට්ටල් බද්ද" නමැති රාජකීය කාර්මික කාර්යාංශයේ පවා ඔවුන් සේවය කොට ඇත. එහි දී ඔවුන් හඳුන්වා ඇත්තේ "හංගිඩි වසම" යනුවෙනි. එම ශිල්පීන් "හංගිඩියන්" යනුවෙන් මෙම යුගයේ දී හඳුන්වා තිබේ.


**ප්‍රචලිත ප්‍රදේශ**

මාතලේ- හපුවිද
තංගල්ල - අඟුල් මඩුව
මහනුවර - හුරීකඩුව
බලංගොඩ - පල්ලේකන්ද

මේ අතරින් වර්තමානය වන විටත් මෙම කලා කර්මාන්තය වඩාත් සක්‍රිය ව පවතින්නේ මාතලේ හපුවිද ප්‍රදේශයේ ය.

**අමුද්‍රව්‍ය**

ලාක්ෂා කලා කර්මාන්තය සඳහා වන ප්‍රධාන අමුද්‍රව්‍යය ලාක්ෂා ය. මේවා ලාක්ෂා නමැති කෘමියාගෙන් ලබා ගනී.




**අමුද්‍රව්‍ය සකස් කරගන්නා ආකාරය**

ලාක්ෂා කෘමියාගේ ශරීරයෙන් පිට වන ලාටු වැනි ද්‍රව්‍යය සුළං වැදී ඝන වී ලාක්ෂා බවට පත් වේ. එම ද්‍රව්‍යය අඩංගු අතු රිකිලි කපාගෙන පවනේ වේළා ඒවායේ ඇති ලාක්ෂා පිහියක් වැනි ආයුධයකින් සූරා ගත යුතු ය. ඉන් පසු කපු රෙදි කඩක ඔතා තදින් ගැට ගසා ළිපට ඉහළින් අල්ලා රත් කොට උණුවෙන පිරිසිදු ලාක්ෂා මිරිකා ඉවතට ගත යුතු ය. එසේ ලබා ගත් ලාක්ෂා නැවත රත් කොට කැබලිවලට වෙන් කොට ගනී.

**සායම් පිළියෙළ කර ගන්නා ආකාරය**

රතු - සාදිලිංගම්
කුඩුකළු - පහන් දූලි හෝ කැකුණ දූලි
කහ - හිරියල්
කොළ - කහ හිරියල් සහ නිල් පාට එකතු කොට සාදා ගත් ලාක්ෂා කෝටු දෙකක සවි කොට ගෙන රත් කර, සායම් කුඩු මිශ්‍ර කර හොඳින් පදම ලැබෙන තුරු අදිමින් සකස් කර ගත යුතු ය.

**ලාක්ෂා භාවිතය**


දැවමය භාණ්ඩවල මතුපිට අලංකාර කිරීම සඳහා පමණක් ලාක්ෂා භාවිත කෙරේ.

**ශිල්ප ක්‍රම**

ලාක්ෂා මඟින් සැරසිලි යොදන ප්‍රධාන ශිල්ප ක්‍රම දෙකකි. (දැවමය භාණ්ඩවල පමණක් ලාක්ෂා මෝස්තර යෙදීම සිදු කරනු ලැබේ.)

**නියපොතු වැඩ -**


මෙහි දී ලාක්ෂා කෙඳි භාවිත කොට සැරසිලි යොදයි. රත් කළ ලාක්ෂා කැබැල්ල ඇඟිලිවලින් අල්ලා ඇදීමෙන් මෙම දික් කෙඳි සකස් කරගත හැකි ය. එක් පැහැයක කෙඳි භාණ්ඩය මත ඇලවීමෙන් පසු අනෙකුත් වර්ණවල කෙඳිවලින් මෝස්තර යොදනු ලැබේ. මේ සඳහා නියපොත්ත භාවිත කරන බැවින් මෙම ක්‍රමය "නියපොතු වැඩ" යනුවෙන් හැඳින්වේ.

නියපොතු වැඩ

**පට්ටල් වැඩ -**

පට්ටලයට අල්ලන ලද භාණ්ඩය කැරකැවෙන විට රත් කර ගත් ලාක්ෂා කැබැල්ල එයට අල්ලනු ලැබේ. එහි දී භාණ්ඩයේ ලාක්ෂා ඒකාකාර ව හොඳින් තැවරේ. විශාල භාණ්ඩ නිර්මාණයේ දී මෙම ක්‍රමය බහුල ව භාවිත වේ. එසේ එක් වර්ණයක් සම්පූර්ණ භාණ්ඩය මත තවරා පසු ව මෝස්තර යොදනු ලැබේ.




පට්ටල් වැඩ

**ලාක්ෂාවලින් මෝස්තර යෙදීම සඳහා භාවිත වන සැරසිලි ඒකක**






ලාක්ෂා භාණ්ඩ අලංකාර කිරීම


වැල්පොත, ලණු දඟය, ගල්බින්දු, බෝකොළ
පළාපෙති, තනි බින්දුව, කුන්දිරක්කන්, තනිපට ලණුව
දෙපට ලණුව

**ලාක්ෂා ආධාරයෙන් අලංකාර කරනු ලබන භාණ්ඩ**

බුලත් තට්ටු, සේසත් මිටි, කොඩි මිටි, හෙල්ල මිටි, බීරළු, බුලත් තට්ටු, සැරයටි, වටාපත් මිටි, උඩැක්කි කඳන්

ලාක්ෂාවලින් අලංකාර කරන ලද භාණ්ඩ



ඉගෙනුම් පල :
- ලාක්ෂා කර්මාන්තයට වඩාත් ප්‍රසිද්ධ ප්‍රදේශ නම් කරයි.
- ලාක්ෂා කර්මාන්තය සඳහා අවශ්‍ය ලාක්ෂා සාදා ගන්නා ක්‍රමය අනුපිළිවෙළින් විස්තර කරයි.
- ලාක්ෂා සැරසිලි සඳහා භාවිත කරනු ලබන ප්‍රධාන ශිල්ප ක්‍රම දෙක විස්තර කරයි.
- ලාක්ෂා භාවිත කොට භාණ්ඩ සැරසිලි කරනු ලබන ආකාරය පැහැදිලි කරයි.
- ලාක්ෂා භාවිත කොට අලංකරණය කරනු ලබන භාණ්ඩ වර්ග සහ මෝස්තර නම් කරයි.

### පසු ඉගෙනුම් අවස්ථා

01. පාඩම හොඳින් කියවා තේරුම් ගන්න.
02. අමාරු යෙදුම් හා තේරුම් ගැනීමට අපහසු වචන වැඩිහිටියෙකුගෙන්, ගුරුවරයෙකුගෙන් විමසා හෝ ශබ්ද කෝෂයකින් බලා අවබෝධ කර ගන්න. සෑම වචනයක්ම සැක නැතිව පැහැදිලි කර ගන්න.
03. ශබ්ද නගා කියවන්න, අමතක වන විට නැවත නැවත කියවන්න. මතකයෙන් පාඩම තවත් අයෙකුට පවසන්න, ඔබ කතාවක් කියන විලසින් හෝ කෙනෙකුට කතාන්දරයක් කියන විලසින් කියාදෙන්න.
04. ලාක්ෂා කර්මාන්තයට අදාළ පින්තූර එකතු කරන්න.
05. ලාක්ෂා නිර්මාණයක සිතුවමක් අඳින්න.
06. මුලින් පැස්ටල් ස්ථරයක් ගා එය මත තවත් වෙනත් වර්ණයන් ගෙන පැස්ටල් ස්ථර කිහිපයක් ගාන්න. පසුව ලාක්ෂා කර්මාන්තයේ මෙන් කුඩා තහඩු කැබැල්ලක ආධාරයෙන් උඩම ඇති පැස්ටල් ස්ථරය කැටයමක ආකාරයට සූරන්න. එවිට යට ඇති වර්ණ රටා මතුවී අලංකාරයක් ගෙනඑයි. එවැනි නිර්මාණ සැලසුම් කරන්න.
07. ලාක්ෂා කර්මාන්තයේදී යොදා ගන්නා නියපොතු වැඩ ආදර්ශයට ගෙන කුඩා සෙල්ලම් බඩු සැදීමට සැලසුම් කරන්න. ලාක්ෂා කර්මාන්තයේ මෙන් ලීයක වර්ණ තැවරීමෙන් කළහැකි නිර්මාණ අත්හදා බලන්න.
08. පහත දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න, තවත් ආදර්ශ ප්‍රශ්න පත්‍ර සොයාගෙන පිලිතුරු ලියන්න, පසුගිය අ.පො.ස.(සා/පෙ) ප්‍රශ්න පත්‍රවල ලාක්ෂා කර්මාන්තය ගැන අසාඇති අදාළ ප්‍රශ්න සඳහා පිලිතුරු ලියන්න. ගැටළු ඇති තැන් ගුරුතුමා සමග සාකච්ඡා කරන්න.

### පොදු ඉගෙනුම් අවස්ථා - පන්ති කාමරයේදී

01. යහළුවන් සමග විෂය කරුණු හා ගැටළු පිළිබඳ සාකච්ඡා කරන්න.
02. අන් අය සතු පාඩමට අදාළ අමතර දැනුම අසා දැන ගන්න.
03. තමා විසින් කළ නිර්මාණය සහෝදර සිසුන් සමග හුවමාරු කර ගන්න.
04. ලාක්ෂා කරමාන්තයට සුදුසු සැරසිලි ගැන සහෝදර සිසුන් සමග අදහස් හුවමාරු කර ගන්න.

### භාහිර ඉගෙනුම් අවස්ථා/සහායක ඉගෙනුම් ආධාරක/ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි දේ.

01. යූ ටියුබ් නාලිකා - https://youtu.be/L9kom-o5OCQ
https://youtu.be/ttpqyE1WoTQ

02.පොත්පත් - ශ්‍රී ලංකාවේ කර්මාන්ත පුරාණය - පී.එම්. සේනාරත්න මහතා.
ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත - ජයදේව තිලකසිරි මහතා.
මධ්‍ය කාලීන සිංහල කලා - ආනන්ද කුමාරස්වාමි මහතා.

03. ඊ පාසල් පාඩම් - ඊ තක්සලාව -
https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=133
ඊ නැණ පියස -
https://www.enenapiyasa.lk/lms/mod/resource/view.php?id=18175

**පහත ප්‍රශ්ණ සඳහා පිලිතුරු සපයන්න.**

ලාක්ෂා කර්මාන්තයට වඩාත් ප්‍රසිද්ධ ප්‍රදේශ සහ ඒ සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍යය නම් කරන්න.
ලාක්ෂා කර්මාන්තය සඳහා යොදා ගන්නා තාක්ෂණ ක්‍රම, ශිල්ප ක්‍රම සහ උපකරණ පිළිබඳ ව විස්තර කරන්න.
ලාක්ෂා භාවිත කොට අලංකරණය කරනු ලබන පාරිභාරික භාණ්ඩ වර්ග සහ යොදා ගනු ලබන මෝස්තර නම් කරන්න.